ResearchGate

See discussions, stats, and author profiles for this publication at: https://www.researchgate.net/publication/362372114

# □□□□□□□□□ 2 □□□□□ □□□□□□□ □□ □□□□□□□□□□□□□□□□ □□□□□□□□□ [Librarians' role modifed by Library 2.0]

**Article** · June 2009

CITATIONS
0

READS
2

1 author:



Ruwan Chinthaka Gamage
University of Colombo

**18** PUBLICATIONS **22** CITATIONS

SEE PROFILE

All content following this page was uploaded by Ruwan Chinthaka Gamage on 31 July 2022.

The user has requested enhancement of the downloaded file.

# පුස්තකාලය 2.0 මගින් සංශෝධනය වන පුස්තකාලයාධිපති කාර්ය භාරය

රුවන් ගමගේ*


## Abstract

It is a long time ago that information scientists predicted Web 2.0 services and technologies are going to affect libraries. Now it's not the time to debate on pros and cons of these. The task at the moment is to explore innovative methods of using these for libraries. This field being developed parallel to Web 2.0 is termed Library 2.0. Chat programmes like Yahoo Messenger, Google Talk and Skype, Social Networking Systems like Facebook, and Ning, Virtual Reality Applications like Second Life, and tools like Wikis, Blogs, and RSS are already linked together with library web sites. The issue here is who is going to take the responsibility on adopting Web 2.0 to your library. This paper describes why and how we should incorporate Library 2.0 to the routine programme of a librarian.

### සාරාංශය

වෙබ් 2.0 සේවා සහ තාක්ෂණික ශිල්ප ක්‍රම පුස්තකාල ක්‍රියාකාරීත්වය කෙරෙහි ඉමහත් බලපෑමක් කරනු ඇතැයි තොරතුරු විද්‍යාඥයන් අනාවැකි පළ කළේ මීට බොහෝ කලකට ඉහත දී ය. දැන් ඒ ගැන වාද කරන කාලය නොවේ. මේ මොහොතේ අවශ්‍යතාවය වන්නේ පුස්තකාල සඳහා මේවා යොදා ගත හැකි නිර්මාණාත්මක ක්‍රමවේදයන් මොනවා දැ යි හෙළි කර ගැනීම යි. වෙබ් 2.0 හා සමගාමීව වර්ධනය වන එම ක්ෂේත්‍රය හැඳින්වෙන්නේ පුස්තකාලය 2.0 යනුවෙනි. යාහු මැසෙන්ජර්, ගූගල් ටෝක්, සහ ස්කයිප් වැනි සල්ලාප මෘදුකාංග ද, ෆේස්බුක්, නිං වැනි සමාජ ජාලකරණ පද්ධති ද, සෙකන්ඩ් ලයිෆ් වැනි අතාත්වික යථාර්ථ වැඩ සටහන් ද විකිකි බ්ලොග් (වියුණු සටහන්), සහ ආර්.එස්.එස්. වැනි උපයෝගිතා ද මේ වන විටත් පුස්තකාල වෙබ් අඩවි හරහා බැඳී පවතී. මේ හා සමගාම ම මතු වන ගැටලුව වන්නේ පුස්තකාලය වෙනුවෙන් පුස්තකාලය 2.0 සේවා පවත්වා ගෙන යන්නේ කවුරුන් ද යන්න යි. ශ්‍රී ලාංකිය පුස්තකාලවේදීන් ගේ කාර්ය භාරය ද මේ අනුව විකාශනය විය යුතු ආකාරය පිළිබඳව මෙම ලිපියෙන් සාකච්ඡා වෙයි.


## 1. හැඳින්වීම

ක්ෂණික පණිවුඩ යැවීම, ගලන මාධ්‍ය, වියුණු සටහන්, ක්ෂුද්‍ර වියුණු සටහන්, විකිකි සමාජ ජාල, සන් තැබීම, සමගෘහිතකරණය, අතාත්වික යථාර්ථයේ සමාජ සංස්ථා, සහ සමෝධාන යන සේවා/ශිල්ප වෙබ් 2.0 තාක්ෂණ යටතට ගැණේ (පළමු ඇමි නුම බලන්න). අප පාඨකයන්ට තොරතුරු බෙදා හරින ක්‍රම සහ පුස්තකාලය පාඨකයා අතරට ගෙන යාමේ ක්‍රමවේදවල සුසමාදර්ශී වෙනසක් ඇති කිරීමට ඒවා ක්‍රියා කර ඇති නිසා, මේ සියල්ල එකතුව පුස්තකාලය 2.0 යනුවෙන් ජාලගත පුස්තකාලවල දෙවැනි පරම්පරාවක් ද නම් කෙරේ.

### 1.1 පුස්තකාල සේවාවේ ප්‍රගමණය

Shultz (2006) පෙන්වා දෙන අන්දමට පුස්තකාලයේ වර්ධන අවධි සතරකි.

පුස්තකාලය 1.0 - පොත් යනු පාරිභෝගික භාණ්ඩයකි. අතීත පුස්තකාලවල සිට කාර්මික යුගය දක්වා පැවති තත්ත්වය මෙය යි.

පුස්තකාලය 2.0 - පොත්, බහුමාධ්‍ය වැනි ඩිජිටල් එකතු රැසක් නිදහසේ භාවිත කිරීම සඳහා වෙබ් අඩවි හරහා ලබා දෙයි. සහ ක්‍රියාකාරී, අන්තර්ක්‍රියා බහුල, ගතික ස්වභාවය ද ඇත.

පුස්තකාලය 3.0 - තුන් වැනි මානය කරා විකාශිත ඩිජිටල් පුස්තකාල වේ. සෙකන්ඩ් ලයිෆ් වැනි අතාත්වික යථාර්ථයේ පිහිටි පුස්තකාලවලට, එම අවකාශයේ

* Dr.Ruwan Gamage, Senior Assistant Librarian, Technical Services, University of Moratuwa.
E-mail · mailruga@gmail.com

> සැරිසරන ඩිජිටල් අවතාර (avatars)[2] පිවිස අවශ්‍ය තොරතුරු ලබා ගනී. එකතු පවා අතාත්වික වන නමුත් ඒ එක් එක් සම්පත (පොත) පිළිබඳව ලේ-ඇට-මස් සහිත පුද්ගලයන් විසින් ලියන ලද සඳහන්වා දීම් ඇත. එවැනි එක් එක් ගැඩින්වීම අතිශයින් පෞද්ගලික අත්දැකීම් මත ලියැවුණු ඒවා විය හැකි නමුත් පොතේ අන්තර්ගතය තීරණය කිරීම සඳහා ඒවා බෙහෙවින් වැඩදායක විය හැකි ය.

පුස්තකාලය 4.0 - අනාගතයේ පුස්තකාලය මෙ සේ වෙතැ යි අපි බලාපොරොත්තු වෙමු. මේ මට්ටමේ දී පුස්තකාලය යනු සෞන්දර්යාත්මක අත්දැකීමක් වනු ඇත. එය වඩාත් දියුණු අතාත්වික යථාර්ථයෙන් අනූන වෙයි. භෞතික පුස්තකාලය ද මීට ම බැඳි දැනුම ස්පාවක් (spa) ලෙස භාවිත කෙරෙන්නට ඉඩ තිබේ. ඔබ පුස්තකාලයට යන්න - දැනුමින් පිරුණු තොරතුරු තාක්ෂණ අවකාශයේ හාන්සි පුටුවක දිග ඇදී තේ කෝප්පයක රස බලමින් මස්තිෂ්කයට දැනුම කාන්දු වෙන්නට ඉඩ හරින්න.[3]
මේ අනුව, පුස්තකාල සේවාව නූතන තොරතුරු තාක්ෂණය සමග මුහු වී වර්ධනයක් පෙන්නුම් කිරීම අනිවාර්ය වේ. අප ද එහි පල නෙළා ගනිමින් ඉදිරියට ගමන් කළ යුතු ය.

## 2. වෙබ් 2.0 තාක්ෂණ හා සේවාවන් හි පොදු ගුණාංග

ඒවා ස්වභාවයෙන් ම සහයෝගී (collaborative) ය. අන්තර් ක්‍රියාකාරිත්වයෙන් යුතු ය (interactive). ගතික ය (dynamic). එසේ ම, එම පරිසරයේ අන්තර්ගතය නිෂ්පාදනයන්, පරිභෝජනයන් අතර සීමාව අපැහැදිලි ය. කොටින් ම කිවහොත් වැඩිමනත් අන්තර්ගතය ලියැවෙන්නේ ද පරිභෝජකයන් අතිනි. එහෙයින් ස්ථිතික, මලානික, සාම්ප්‍රදායික වෙබ් අඩවිවලට සමු දිය යුතු කාලය එළඹ තිබේ. වෙබ් 2.0 (එසේ ම පුස්තකාලය 2.0) පරිසරයේ ස්වභාවය පහත දැක්වෙන අයුරින් සාරාංශගත කළ හැකි ය.

- එය පෙළ (ඇංව) අඩවියක් නොවේ... බහුමාධ්‍ය (multimedia) අඩවියකි.
- එය ලියන්නා වටා ගෙතුණු අන්තර්ගතයක් නොවේ...පරිශීලකයා (user) වටා ගොඩ නැගුනකි.
- එය තනිව දක්වන අදහස් සමූහයක් නොවේ... දෙබස්, නැතහොත් සාකච්ඡාමය පරිසරයකි.

### 2.1 පුස්තකාලය 2.0

O'Reilly (2005) දක්නා පරිදි, පෞද්ගලික වෙබ් අඩවි බ්ලොග් අඩවි බවට පරිණාමය වෙයි. විශ්වකෝෂ, විකිපීඩියා (Wikipedia) බවටත්, පාඨ ග්‍රන්ථ, ගලන මාධ්‍ය (streaming media) යෙදුම් බවටත්, වර්ගීකරණ, සමාජ වර්ගීකරණ (folksonomy) බවටත්, ඊමේල් මගින් කෙරුණු පාරිභෝගික සබඳතා පවත්වා ගැනීම්, ක්ෂණික පණිවුඩ මාධ්‍යයටත් (instant messaging) තවදුරටත් විකාශය වී ඇත. එසේ ම Video on Demand - වී ඕ ඩී (අදාළ සබැඳුමක් මත ක්ලික් කිරීමෙන් පරිශීලකයාට අවශ්‍ය වීඩියෝව නැරඹීම) යූ ටියුබ් (YouTube) ආකෘතියට පරිණාමය වී තිබේ. වී ඕ ඩී සම්ජය සසඳන විට, එක ම වීඩියෝවේ වෙනත් අනුවාදයන් ලබා ගැනීමට පරිශීලකයාට හැකි වීම, වඩාත් පරිශීලක-හිතවත් (user friendly) වීම, පාඨ ලෙස හෝ වීඩියෝ ලෙස ම ප්‍රතිචාර (feedback) දැක්වීමට හැකි වීම යූ ටියුබ් ආකෘතියේ විශේෂත්වය යි. එහි ඕනෑම වර්ගයක වීඩියෝ ක්ලිපයක් සපයා ඇත්තේ යූ ටියුබ් සාමාජිකයන් ම ය. ඔබේ පුස්තකාලයේ පරිශීලකයන් සඳහා තැනූ වීඩියෝව ඔබට ම යූ ටියුබ් එකට උඩුගත (upload) කළ හැකි ය. හිමිකම් ගැන වැඩි තැකීමක් නැති මෙහි දී කරන හිමිකම් සුරැකීම නම්, අදාළ නිතිමය හිමිකම දරන්නා ගේ ඉල්ලීම පරිදි එම වීඩියෝව වෙබ් අඩවියෙන් ඉවත් කිරීම යි. එක් අතකට කිසියම් වීඩියෝවක් යූ ටියුබ් ගොනුවකට උඩුගත කරන්නේ කුඩා කොටස් වශයෙනි. එසේ ම එම වීඩියෝව තත්ත්වයෙන් බාල කොට කුඩා ගොනුවක් බවට පත් කර ඇත. ඒ, ඉක්මනින් බා ගත වීම පහසු කිරීමට යි. එනයින් බලන විට වීඩියෝවක් යූ ටියුබ් හි තිබීම එය වඩා ජනප්‍රිය කිරීමට හේතුවකි. අධ්‍යාපන සහ වෙළෙඳ ආයතන සඳහා එය සුජාත ප්‍රචාරක යාන්ත්‍රණයක් බවට ද පත්ව තිබේ. බටහිර ලෝකයේ දියුණු පුස්තකාල පවා එහි ඵල මැනැවින් නෙළා ගනිමින් සිටී[4].

---

[2] පරිගණක ලෝකයේ avatar යනු මෙලොව සිටින පුද්ගලයකු ගේ ඩිජිටල් නියෝජනය යි. තම සිතුම් පැතුම් සහ සැබෑ ස්වරූපය බාහිරයට පෙනෙන ලෙස තමාට කැමති ලෙස ඇඳුමින් පැළඳුමින් ද, හිසකේ ආදියෙන් ද සරසා ගත හැකි ය.
[3] බොහෝ දුරට බටහිර පුස්තකාල චින්තකයන් බිහි කළ අදහසකි. පෙරදිග ලෝකයේ පුස්තකාල අනාගතය පිළිබඳව වෙන ම සාකච්ඡා කළ යුතු ය.
[4] මෑතක සිට අධ්‍යයන වීඩියෝ අඩවියක් ද, අධි-විභේදන (high definition) වීඩියෝ ක්ලිප ද බලගන්වා ඇත.

මෙම විප්ලවය පුස්තකාල වෙත බලපා ඇති ආකාරය ඉතා විශාල ය. අප ගේ පාඨකයන් අන්තර්ගතය නිර්මාණයේ යෙදී සිටීම, තොරතුරු ප්‍රචාරණයට සක්‍රිය ව දායක වීම සහ පුස්තකාල වෙබ් අඩවිය මඟින් තමන් හා සම්බන්ධ වීම තරම් සතුටක් පුස්තකාලයාධිපතිවරයකුට තිබිය හැකි ද? කෙසේ වෙතත් පුස්තකාලයාධිපතිවරු මෙම කරුණ පිළිගන්නට පටන් ගත්තේ මෑතක සිට ය. මේ වන විට බොහෝ පුස්තකාලයාධිපතිවරු බ්ලොග් අඩවි රචකයෝ ය. බොහෝ පුස්තකාල වෙබ් අඩවි පුස්තකාලය 2.0 බවට රූපාන්තරණය වෙමින් පවතී (Miller, 2006" Notess, 2006). කෙසේ වෙතත් ගැටලුව වන්නේ සියලු වෙබ් 2.0 අංග (බ්ලොග්ස් විකිස් සමාජ ජාල ආදිය) ඇතුළත් කර ගැනීමට තරම් කාලය ප්‍රමාණවත් ද යන්න යි. දැනටමත් පුස්තකාලයාධිපතිවරු තම දෛනික කළමණාකරන කටයුතුවලට අමතරව ඉගැන්වීම, පර්යේෂණ වැනි අමතර කටයුතුවල ද යෙදෙති. මේ අතරට දෙවැනි පරම්පරාවේ අතිශය අන්තර්ක්‍රියාකාරී පුස්තකාල වෙබ් අඩවියක් පවත්වා ගෙන යාම කළ හැකි ද? නොඑසේ නම්, අඩු තරමින් එවැනි වෙබ් අඩවියකට නායකත්වය දීම පවා ප්‍රායෝගික නැති ද? ඇතැම් කුඩා පුස්තකාලයකට සරල සාමාන්‍ය වෙබ් අඩවියක් පවත්වා ගෙන යාම පවා අපහසු වන විටෙක මෙවැනි ප්‍රශ්නයක් නැඟීම සාධාරණ ය. ඊට පිළිතුරු දීමට මත්තෙන් දෙවැනි පරම්පරාවේ ඩිජිටල් පුස්තකාලයක පුස්තකාලයාධිපතිවරයකු ගේ දෛනික රාජකාරි කවරේදැයි බලමු. මුල් ම ඩිජිටල් විප්ලවයේ දී පුස්තකාල ග්‍රහණය කර ගත් වෙනස ස්ථිතික ය. උදාහරණ ලෙස, මාර්ගගත පොදු ප්‍රවේශ සූචියකින් (OPAC) කෙරෙන්නේ පොත්පත්වල ග්‍රන්ථවිද්‍යාත්මක තොරතුරු ගවේශනය යි. එහි දී පරිශීලකයා ගේ මූලපද (keywords) සමග පුස්තකාලයාධිපතිවරු ඇතුළත් කළ පාරදත්ත (metadata) සන්සන්දනය කෙරේ. එහෙත් එම පරිශීලකයා මීට පෙර භාවිත කර ඇති මූලපද, ඔහු/ඇය විසින් ඉල්ලා ඇති විපරම් (alert) සහ අතීතයේ බැහැර ගෙන ගොස් ඇති පොත් පත් යනාදිය පිළිබඳ මතකය අවදි කර ගැලපෙන පොත් යෝජනා කළ හැකි නම්, එය වෙබ් 2.0 තාක්ෂණයේ භාවිතාවකි. පුස්තකාලයක් නොවුනද, ඇමසන් ඩොට් කොම් (Amazon.com) සුවිසල් අන්තර්ජාල පොත්හල සිදු කරමින් සිටින්නේ එය යි. ඉතා සෙමින් වුවද වෙබ් 2.0 දිශාභිමුඛ ගමන පුස්තකාල විසින් අරඹනු ලැබ තිබේ (Maness, 2006). පුස්තකාලය 2.0 හි ප්‍රධාන ලක්ෂණය තාක්ෂණය නොවේ - ආකල්ප වෙනස යි (O'Really" 2005).

අපි අපේ පාඨකයන් විශ්වාස කළ යුතු වෙමු. ඔවුන්ට විපුල අත්දැකීමක් රැස් කර ගැනීමට ඉඩ දිය යුතු ය. එසේ ම විවිධ මූලාශ්‍රවලින් තොරතුරු සංකලනය කොට නව නිර්මාණ කිරීමට තරම් හිමිකම් ලිහිල් කළ යුතුයැයි. යි ඕරිලි (O'Really" 2005) පවසයි.

## 3. පුස්තකාලය 2.0 යෙදීම

### 3.1 පුස්තකාලයට පාඨකයා සමීප කර ගැනීම

පුස්තකාලයට පාඨකයා ගෙන්වා ගැනීමේ ක්‍රම වේදය සාර්ථකවනවාට වඩා වේගයෙන් පුස්තකාලයෙන් පාඨකයා ඈත් වීමේ ප්‍රවණතාවය වැඩි බව ඕනෑම පුස්තකාලයාධිපතිවරයකු කියනු ඇත. මෙහි දී පුස්තකාලය 2.0 මඟින් ලබා දෙන ආදර්ශය වන්නේ පාඨකයා සිටින තැනට පුස්තකාලය ගෙන යමු යන්න යි. මෙහි වැදගත්කම නම්, මෙතෙක් සිටි පාඨක පිරිසට අමතරව අලුත් ම පාඨක ගහනයක් හඳුනා ගැනීමට අවකාශ ලැබීම යි. එසේ ම පුස්තකාලයට මානුෂික මුහුණුවරක් ලබා දීමට මෙමගින් හැකියාව ලැබේ. පුස්තකාලයේ එක්තරා මුල්ලක, ඇතැම් විට කුටියක හිර වී සිටින පුස්තකාලයාධිපතිවරයකු වෙනුවට මෙහි දී පාඨකයාට මුණ ගැසෙන්නේ, මානුෂික හැඟීම් වලින් පිරුණු, බ්ලොග් අඩවියකින් විවෘතව අදහස් දක්වන වඩාත් ප්‍රියමනාප පුස්තකාලයාධිපතිවරයෙකි/වරියකි. පාඨකයා එම පුස්තකාලයාධිපති ගේ ලිඛිත (හෝ ශබ්ද-වීඩියෝ රූප ආදියෙන් ප්‍රකාශිත) අදහස්වලට ප්‍රතිචාර දක්වයි. දෙදෙනා ම ෆේස්බුක් (Facebook) හි දී හමු වෙති. පාඨකයා ක්ෂණික පණිවුඩ (instant messaging)[5] මාර්ගයෙන් පුස්තකාලය ගැන විමසූ විට ඊට පිළිතුරු ලෙස යූ ටියුබ් හි ඇති වීඩියෝවක් නැරඹීමට පුස්තකාලයාධිපතිවරයා විසින් ඔහු යොමු කරනු ලැබේ. දෙදෙනා ම කිසියම් මොහොතක සිදු කරමින් සිටින්නේ කුමක්දැ යි ට්විටර් (Twitter) මාර්ගයෙන් ප්‍රදර්ශනය වෙයි. නව අත්දැකීම් රැස් කර ගන්නා පරිදි පාඨකයා පුස්තකාල විකිය (wiki) පෝෂණය කරයි. මේ සියලු වර්ධනයන් එක් තැනක සිට නැරඹීමට ආර් එස් එස් (RSS) පහසුකම් ඇත.

### 3.2 ප්‍රචාරණය

ඔබේ පුස්තකාලයේ වැඩි පිරිස තරුණ පාඨකයන් ද? ඔබේ මව් ආයතනය පරිගණක තාක්ෂණය යහමින් භාවිත කරන්නේ ද? එසේ නම් ඔබේ පාඨකයන්ගෙන් වැඩි කොටස වෙබ් 2.0 පරිසරය හොඳ හැටි හුරු පිරිසක් විය යුතු ය. ඔවුන් අතරට පුස්තකාලය ගෙන යාමෙන් ඔබේ පාඨකයන්ට වැඩි සේවාවක් කිරීමට හැකි වේ. මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ තරුණ පරපුර වැඩි පිරිසක් වෙබ් 2.0 පරිසරයේ වැඩි කාලයක් ගත කිරීමට

[5] දැනටමත් බොහෝ පුස්තකාලවල මෙය 'පුස්තකාලයාධිපතිගෙන් අසන්න' (Ask-a-librarian) සේවාවන් සඳහා මෙය භාවිත වේ.

හුරු වී ඇති බව යි. අවුරුදු 12-18 වයසේ දරුවන් ගෙන් සියයට 30 ට වැඩිගෙන් දිනපතා පැය දෙකකට වඩා සමාජ ජාල වෙබ් අඩවි තුළ ගත කරන බව නොර්වේජියාවේ මැලින් මාලට් ලාසන් (Larsen, 2008) පවසන්නී ය. යම් පොතකින් හෝ විත්තිය සාධකයන් එසේ නොපවතී නම්, ඔවුනොත් සඳහා නොගත් සාධක ප්‍රජාවක් අලුතින් සඳහා ගැනීමට ඔබට පුස්තකාලය 2.0 තුළ දී හැකි වනු ඇත. දැන්. ඔබේ පුස්තකාලයේ ප්‍රචාරක යාන්ත්‍රණ ශක්තිමත් කිරීම සඳහා යූ ටියුබ් අඩවියට වීඩියෝවක් උඩුගත කිරීමට ද, ට්වීටයක් ලියා දිගිනිවියාවේ ඇත්තන් කිරීමට ද, බ්ලොග් අඩවියක් මගින් නිදහස් අදහස් දැක්වීමට ද ඔබ බලාපොරොත්තු වනවා ඇත.

### 3.3 නව තොරතුරු මාධ්‍ය

ඔබගෙන් ලබා දුන්නේ භෞතික සම්පත්වලින් පිරුණු පුස්තකාලයක් පමණක් ද? දැන් ඉලෙක්ට්‍රොනික සම්පත්වලින් ද පුස්තකාලය පුරවන්න. මේවා සිඩි ආයතනය මගින් හෝ පෞද්ගලිකව හෝ විවිධ සම්පත් එක් කොට සැලසුම් සහෝදායික නිර්මාණ විය හැකි ය. හැකිතොත් පුස්තකාලය මගින් මිලට ගැන්නූ දෑ විය හැකි ය. සඩ, රූප, පාඨ ඇතුළු විවිධ ආකෘතිවලින් එවා ඉදිරිපත් කළ හැකි ය.

### 3.4 නව තොරතුරු පරිසර

සෙකන්ඩ් ලයිෆ් (Second life) වැනි අතථ්‍ය අවකාශවලට ලාංකිකයන් ගේ සැහුරුව කොතෙක් දැයි තවම පැහැදිලි නැතත්, එය ද වෙනත් ජීවිතයක් සමාජ ජාලයක් මෙන් නිහැඬ පරිශීලක පිරිසක් සරා පහසුවෙන් ඇදෙන සෙවුමකි. දැනට ලොව පුරා මිලියන සෙකන්ඩ් ලයිෆ් පරිශීලක සංඛ්‍යාව පැවසෙන්නේ මිලියන ගණනකි. එයින් වැඩි සිරිත යුරෝපා ජාතිකයන් බව මාධ්‍ය වාර්තා දක්වයි. අතථ්‍ය ලිබ්‍රාණ අවකාශය අත හරා කෙමින් ඇදෙන්නේ එහි ආකර්ශනීය බව අඩු නිසා නොව, එම වෙබ් අඩවිවල මිනුලම ඇති ත්‍රිමාණ චිත්‍රක ක්‍රියා කිරීමට අප බොහෝ දෙනා සතුව පවත්නා අන්තර්ජාල පහසුකම්වල ශක්තිය ප්‍රමාණවත් නොවන බැවිනි. එක්සත් ඇමෙරිකානු පුස්තකාල සංගමයත් (ALA), පුස්තකාල වෘත්තිකයකුත් මේ අවකාශයෙන් ඉඩම් මිල දී ගෙන දැනටමත් අථ්‍යන පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන තනා ගෙන සිටිති. භෞතික පරිසරයේ ඇති භෞතික පුස්තකාලයකට පවා සමානිකයන් එක් රැස් වන්නා සේ, අතථ්‍ය පරිසරයේ සිටින අතථ්‍ය සාමාජිකයෝ තම තොරතුරු අවශ්‍යතා සඳහා මෙවැනි පුස්තකාල වෙත එක් රැක් වෙති. එම ආයතනවල ඇති අතථ්‍ය ඉලෙක්ට්‍රොනික මුද්‍රලට හෝ දායකත්ව පදනම මත ලබා ගනිති. එම පුස්තකාලවලින් සංවිධානය කෙරෙන විවිධාත් දේශනවලට සවන් දීම සඳහා අතථ්‍ය දේශන ශාලාවල විවිධ ආකාරයෙන් ඇඳී ගෙන සිටින අවතාර. මෙවැනි පරිසරයක සුලභ දර්ශනයකි.

### 3.5 නව ඉදිරිපත් කිරීමේ ක්‍රම

කාමාත්‍ය වෙබ් අඩවි බ්ලොග් බවට පෙරැල්මින් පවතින බව අප දැනටමත් පරිකා ඇත. බ්ලොග් ආකෘතිය මගින් සිදු කෙරෙන්නේ අලුතෙන් ඉදිරිපත් කෙරෙන ලිපි ඉහළින් පෙනෙන ලෙස සංවිධානාත්මකව වෙබ් අඩවිය සකස් කිරීම යි. එය සරල අන්තර්ගතය කළමනාකරණ පද්ධතියක් (content management system - CMS) ලෙස මෑත යුගයේ බොහෝ මෘදුකාංග නිර්මාණකරුවන් විසින් සංවර්ධනය කරන ලද ආකෘතියකි. මිට අමතරව වර්තමානයේ වර්ඩ්ප්‍රෙස්. ගූගල් බ්ලොගර් වැනි සේවා සපයන්නන් පවිතේ නිදහස් හා නොමිලයේ ලැබෙන සේවාවන් ලෙස ඉතා පහසුවෙන් බ්ලොග් අඩවියක් පිහිටුවා ගත හැකි ය. ඇත්තෙන් ම නව පුස්තකාලයට අන්තර්ජාලයේ ඉඩ කඩ වෙන් කර දිය හැකි පහසු ම හා ලාභම ක්‍රමය ලෙස ද මෙය දැක්වේ (Guevara, 2008).

### 3.6 පුස්තකාල සුචිය

2007 වසරේ පැවැත්වුණු නව අදහස් සංසදයේ දී (Innovative Ideas forum - 2007) මතු වූ වැදගත් අදහසක් නම්, පුස්තකාල සුචිය සම්පත් සෙවීමටත්, ස්වාමිය සම්පත්වලින් එහා (බාහිර) එකතු වෙත ප්‍රවේශය ලබා දීමටත්, එකිනෙකට වෙනස් සම්පත් වර්ග සැවසුවකින් අනාවරණ දර්ශකය සැරවීමටත් සමත් එක-විරාම සාප්පුසලක් (one-stop shop) විය යුතු බව යි. එය ගූගල්, ඇමසන්, ලයිබ්‍රරි තිං, විකිපීඩියා, ෆ්ලිකර්, ඩිග්, යූ ටියුබ්, ටෙක්නෝරාටි ගුටන්බර්ග්, ඉන්ටර්නෙට් ආකයිව්[*] වැනි ආකෘති සමග සැලපී, එකිනෙකා පෝෂණය කර ගනිමින් පැවතිය යුතු බව එහි අදහස යි.

### 4. සමාලෝචනය

පුස්තකාලය 2.0 විවිධ නුහුනුවරින් මෙහි පිවිත බව අපි දැනටමත් පැවසුවෙමු. බ්ලොග්, විකි, යූ ටියුබ් ඇතුළු මේ සහායකුත් පොදුම් වෙත මෙහ මෙහ ම අවධානය යොමු කරන්නට යාමේ දී කාලය මෙසෙවින් වැය වේ. එනිසා

[*] මේවා සෙවුම්කම්සේ තොරතුරු සේවා සපයන අතර ඇ, ව්‍යාපාර ආයතන ද වේ.

වස පහසු කරන අන්තර්ජාලයත් කළමනාකරනය කිරීමේ මෘදුකාංග (සඩ) දැන් ඕනි වී ඇත" උදාහරණ ලෙස ඩ්‍රුපල් (ඩ්‍රැදුකස්)කී ඩෑපල් (දෙකපිකා) වැනි ඒවි ගොඩිලුනෙය් හා ගත හැකි වන අතර මනී පරිශීලක කිහවක් ද, වෙබ් ඩ්‍රුපල්ව භාවිතයෙන් දහස් ගණන් වෙබ් අඩවි නිර්මාණය වන අතර පුස්තකාලවලට ගැලපෙන නව පිහිටුවා ගැනීමකි රූප ඇල්බම්ස්, ක්‍රීම් ගබඩා ආදී, පහසුකම් රැසක් විවිධ මාදිලියෙන් මෙවාට එක් වෙමින් පවති"

## 4.1 සමාජ ජාල නිර්මාණ යෙදුම්

සමාජ ජාල නිර්මාණය කිරීමට පහසුකම් සපයන නිදහස් වෙබ් අඩවි රැසක් අපට අන්තර්ජාලයේ හමු වේ. උදාහරණ ලෙස නිං, ෆේස්බුක්, මයිස්පේස් (Myspace) දැක්විය හැකි ය. මෙය දැනට භාවිතයේ ඇති ශ්‍රී ලංකා පුස්තකාල මිතුරු ඉ-සංසදයට (SLLF) වඩා ඉදිරියට ගිය විසඳුමකි. SLLF මගින් ප්‍රධාන වශයෙන් කෙරෙන්නේ සාමාජිකයන් අතර ඊමේල් මාර්ගයෙන් තොරතුරු හුවමාරු කර ගැනීම පමණි. එහෙත් මෙවැනි වෙබ් අඩවියක මගින් ඊ-සංසදයක් පිහිටුවීමෙන් පසු එය විශාල ලේඛනයක් වශයෙන් ව්‍යාප්ත කර ගත හැකි ය. එසේ ම වෙනත් සමාජ ජාල සමග සම්බන්ධ වීම ද එමගින් පහසු කරයි.

## 5. අභියෝග

### 5.1 පරම්පරා අතර වෙනස

අප වඩා සූක්ෂමව අධ්‍යයනය කළහොත්, ජ්‍යෙෂ්ඨ පුස්තකාලාධිපතිවරුන්, කනිෂ්ඨ පුස්තකාලාධිපතිවරුන් සහ (අධ්‍යයන පුස්තකාලයක් නම්) පරිශීලකයන් සිටින්නේ වෙනත් මූලණු (cohort) වල යි. පුස්තකාලාධිපතිවරු බොහෝ විට "බිළිඳු උත්පාත අවධියේ" හෝ 'එක්ස්-පරපුරේ" උපත ලැබුවෝ වෙති. ඔවුන් සේවය කරන්නේ 'සහශ්‍ර වාර්ෂිකයන්ට ය; (පහත වැනි වගුව බලන්න).

| වයස | උපන් යුගය | පරපුර | විස්තරය | ලක්ෂණ |
|---|---|---|---|---|
| 66-87 | 1922-1943 | වෘද්ධ | විධාන දෙයි. මගින් පෙන්වයි. | තමාට පෙර පරම්පරාව යන මතය දරයි. |
| 49-65 | 1943-1960 | බිළිඳු උත්පාත අවධිය | නායකත්ව ලක්ෂණ පෙන්වයි. පළමුව සිටීමේ සිතීම සහ උදාර ගුණ සහිත ය. | සේවයට ළැදි ය. අනාගතය ගැන සිතයි. |
| 29-48 | 1981-2000 | එක්ස් පරපුර | තොරතුරු යුගයේ ඉපදුණි, පස්සර දිවියත් අතට ගනී. | තම පිළිබඳ විශ්වාසයෙන් යුතු යි. තාක්ෂණයට බර යි. |
| 9-28 | 2000 ට පසු | වයි පරපුර (සහශ්‍ර වාර්ෂිකයෝ) | එකිනෙකා අතර සම්බන්ධතා (connectivity) වැඩි ම පරපුර යි. රැකියා රහිත හා රූගම තාක්ෂණ මගින් එය ඉටු කර ඇත. | සර්ව අභිමුඛ වන අතර ප්‍රායෝගිකත්වයට පිය යි. බෝනස් ආශ්‍රිත ජීවනය බලාපොරොත්තු වෙයි. |

වගුව 1. පරම්පරා වෙනස (**Generations at Work.** ඇසුරිනි - **Zemke Raines and Filipczack"** 2000)

මෙහෙයින් සෛද්ධාන්තිකව සම්පූර්ණයෙන් වෙනස් ලක්ෂණ සහිත කණ්ඩායමකට පහසුකම් සපයන්නට වීම, පුස්තකාලවේදීන්ට මුහුණ දීමට සිදු වන අභියෝගයකි, පහසුකම් ලබන්නා ගේ මනසින් සිතා එය කළ යුතු ය. ජාල-ඇසිරු, අන්තර්ගතය, යුග ගණන් පැරණි ක්‍රම භාවිතයෙන් බෙදා හැරීම තවදුරටත් වලංගු නොවේ. දැන් ඇත්තේ පරිශීලක අවශ්‍යතා මත ක්ෂණිකව ඇසිරෙන තොරතුරු පෝෂක ලබා දෙන යුගයකි. පුස්තකාලාධිපතිවරයා පාඨකයා ගේ තත්ත්වයේ සිට තොරතුරු ප්‍රවාහන මං සෙවිය යුතු බව නවීන ආකාරයකින් ගත හොත්, වයි පරපුරේ පාඨකයන්ට නව පුස්තකාල සේවා සැපයීමේ වගකීම, එනම් කනිෂ්ඨ පුස්තකාලවේදීන්ට පැවරීම වඩා සාර්ථක විය හැකි බව පෙනෙයි (Gamage 2009).

### 5.2 නව කාර්ය භාරයන්ට හුරු වීම

අනාගත පුස්තකාලයක් නිර්මාණය කිරීම සඳහා පුස්තකාලාධිපති වරයා සතු විය යුතු හැකියාවන් මොනවා දැ යි එච්. ඩ. යාපා (2003) පෙන්වා දෙයි. ඒවා නම්, විද්‍යුත් සම්භාර සංවර්ධනය, දත්ත සමුදා ප්‍රවර්ධනය, වෙබ් පිටු

නිර්මාණය, අනතප පුස්තකාලයේ නඩත්තුව ආදිය යි. මෙසේ හෙයින් නව පුස්තකාලවේදියා දිනෙන් දින අළුත් වන තොරතුරු තාක්ෂණයන් පිළිබඳව අවධියෙන් සිටිය යුතු ය. කෙසේ නමුත්, මෙය වෘත්තිය පුස්තකාලවේදියාට පමණක් යෙදිය හැකි කාර්යයක් නොවේ. පුස්තකාල තාක්ෂණ ශිල්පීන් ද දැනුමෙන් සන්නද්ධ විය යුතු ය. කැලිෆෝනියාවේ සැන්ටා ක්‍රෲස් මහජන පුස්තකාලයේ (SCPL) සියලු පුස්තකාල සේවකයන් වෙබ් 2.0 පිළිබඳව දැනුවත් කිරීම සඳහා පැවැත්වුණු වැඩමුළුවක් පිළිබඳව ටයිටැන්ගොස් සහ මේසන් (Titangos and Mason) 2009) වාර්තා කරති. 23Things@SCPL නමින් සංවිධානය කෙරුණු මෙම වැඩමුළුව ආරම්භයේ, සේවකයන් නව තාක්ෂණයෙන් හෙම්බත් වු නමුත්, පසුව වඩාත් පහසුවෙන් හා ආශාවෙන් වෙබ් 2.0 තාක්ෂණ භාවිත කරන්නට පටන් ගත් බව ඔවුහු පවසති. මෙවැනි යවිද්වි අධ්‍යයන කටයුතුවලට අමතරව, විධිමත් අධ්‍යාපන වැඩසටහන් වලට ද පුස්තකාලය 2.0 පිළිබඳ දැනුම ඇතුළත් කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

### 5.2.1 කළ යුත්තේ කුමක් ද?

අප මේ වන විට කරමින් සිටිය යුත්තේ කුමක්ද‍ෟ යි පැහැදිලි කර ගැනීමට, Shultz (2006) ගේ තර්කය විමසා බලමු.

> 'මේ වන විට සමාජ ජාල සහ අනෙකුත් වෙබ් 2.0 තාක්ෂණ අප ගේ පරිශීලකයන් වෙත වැදී හමාර ය. ඒවායින් ප්‍රයෝජන ගෙන නව සේවා ලබා දීම හෝ පුස්තකාලය ප්‍රචාරණයට භාවිත කිරීම එක් පැත්තකි. අනෙක් අතට අප ගේ ඇතැම් පාඨකයන් යූ ටියුබ් හෝ ෆේස්බුක් පිළිබඳව කුතුලෙන් සිටිනවා විය හැකි ය. ඔවුන් ඒ පිළිබඳව ඇති වායි හෝ අනතුරු පිළිබඳව පුස්තකාලයෙන් මග පෙන්වීමක් ලැබෙන තුරු ඔවුන් බලා සිටින්නට ඉඩ තිබේ. එය ලබා දීම පුස්තකාලයාධිපතිවරයා ගේ වගකීම යි. එහෙත් දැනට අප බොහෝ විට කරන්නේ පාඨකයන් යූ ටියුබ් හෝ ෆේස්බුක් අඩවි ගවේෂණයේ යෙදෙන විට එම අඩවිවලට පිවිසීමට නොහැකි ලෙස අන්තර්ජාලය අවහිර කිරීම යි. ඊට හේතු ලෙස, ප්‍රමාණවත් නොවන අන්තර්ජාල කලාප පළල[7], සම්පත් සීමා සහිත බව, හෝ ඒවා භාවිතයෙන් ගැටවර පාඨකයන් නරකයට යොමු වන බව දක්වමු'

ෂුල්ට්ස් දක්වන පරිදි පාඨකයාට නව දැනුම ලබා දීමේ වගකීම ඇත්තේ අපට බව ද සත්‍යයකි. එසේ ම අප මව් ආයතන විසින් බොහෝ විට පාඨකයන් අන්තර්ජාලයේ සමාජ අඩවි ගවේෂණයෙන් වළක්වනු ලබන බව ද සත්‍යයකි. කලාප පළල වෙනත් කටයුතුවලට යෙදීමේ දී (විශේෂයෙන් ම සෙකන්ඩ් ලයිෆ්, යූ ටියුබ් වැනි අධික වශයෙන් කලාප පළල අවහිර කරන යෙදුම් මගින්) පර්යේෂණ හෝ ඍජු අධ්‍යයන කටයුතු සඳහා භාවිත කිරීමට ඇති අන්තර්ජාල සම්පත ඒ කාර්යයන් සඳහා භාවිත කිරීම අපහසු වෙයි. අන්තර්ජාලය ඉතා මඳ වේගී විය හැකි බැවිනි. සමාජ ජාල භාවිත කිරීමේ කාල සීමා පැනවීම එක් විකල්පයකි. තවද කලාප පළල ප්‍රමාණවත් පරිදි වැඩි කළ හැකි දැයි සොයා බැලිය හැකි ය.

## 6. නිගමනය

පුස්තකාලවේදියා දැනට සිටින සැප-කලාපවලින් එළියට අවුත් පුස්තකාල 2.0 පහසුකම් පාඨකයාට ලබා දිය යුතු කාලය එළඹ තිබේ. මේ සඳහා වැඩි කාලයක් ගත කරන්නට ද, වැඩියෙන් තම සේවක පිරිස මෙහෙයවන්නට ද ඔහුට/ඇයට සිදු වනු ඇත. මේ සඳහා තම දෛනික වැඩ මාලාව සංශෝධනය කළ යුතුවා පමණක් නොව, බ්ලොග් අඩවියට ලිවීම වැනි කටයුතුවල නැවත නැවත යෙදෙන්නට ද පුස්තකාලයාධිපතිවරයා හට සිදු වනු ඇත. එසේ ම පාඨකයන් ගේ ප්‍රතිචාර අනුමත කිරීම, ඒවා විශ්ලේෂණය, සහ පිළිතුරු ලිවීම වැනි නව කාර්යභාරයන් රැසක් ද පැවරේ. කෙසේ නමුත් මේ සියල්ලේ අවසන් ප්‍රතිඵලය වනු ඇත්තේ, වඩාත් හොඳ සහ ගතික පුස්තකාල සේවාවක් සැපයීම යි. පාඨකයාට ද තවමු අත්දැකීම් රැසක් එක් වනු ඇති අතර ඔහු/ඇය දැනුමෙන් වඩාත් සන්නද්ධ වනු ඇත. කාලය පිළිබඳ ගැටලුව ජය ගැනීම සඳහා විශේෂ වෙහෙසක් දැරීමට පුස්තකාලයාධිපතිවරයාට සිදු වේ. ශ්‍රම විභජනය, නව ශිල්ප ක්‍රම එක් කර ගැනීම, නව සේවකයන් බඳවා ගැනීම වැනි ක්‍රම මගින් මෙය කළ හැකි ය.

[7] අන්තර්ජාලය භාවිතයට ඇති බාධාව හෝ පහසුකාව දක්වන මිනුමකි.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. Gamage, Ruwan. From Library 2.0 to Library 3.0: Prospects and Challenges. Paper presented at the NILIS Research Symposium 2009. 20-21 March 2009. National Institute of Library and Information Science, University of Colombo.

2. Guevara, Sophia. Digital Focus: Interview with Michael Stephens, Assistant Professor, Graduate School of Library & Information Science, Dominican University. Volume 25, Issue 3, Bulletin of the Information Technology Division/SLA. Summer 2008 p4-8.

3. Innovative Ideas Forum 2007 website. http://www.nla.gov.au/pub/gateways/issues/87/InnovativeIdeasForum.html (Accessed 10.03.2009)

4. Larsen, MC. How much time do Danish youngsters spend on social network sites? (article on a personal web site of a PhD student). http://malenel.wordpress.com/2008/02/14/how-much-time-do-danish-youngsters-spend-on-social-network-sites/. Visited on 11 May 2009.

5. Maness, Jack M. Library 2.0 Theory: Web 2.0 and Its Implications for Libraries. Webology, Volume 3, Number 2, June, 2006.

6. Miller, P. (2006). Coming together around library 2.0: a focus for discussion and a call to arms. D-Lib Magazine, (12) 4, 2006. http://www.dlib.org/dlib/april06/miller/04miller.html (Accessed 10.03.2009)

7. Notess, G. R. (2006). The terrible twos: web 2.0, library 2.0, and more. Online, 30 (3), 40-42.

8. O'Reilly, T. (2005). What is web 2.0? http://www.oreillynet.com/pub/a/oreilly/tim/news/2005/09/30/what-is-web-20.html#mememap (Accessed 10.03.2009)

9. Schultz. Wendy. Web 2.0: Where will it take libraries. NextSpace. No.2. 2006.

10. Titangos, HLH. Mason, GL. Learning Library 2.0: 23 Things @SCPL. Library Management. Volume: 30 Issue: 1/2 Page: 44 - 56. 2009

11. යාපා, එන්.යූ. අනාගත පුස්තකාල හා තොරතුරු තාක්ෂණය, Sri Lanka Library Review. Vol 17. June 2003.



View publication stats